---

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නාවූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2011 දෙසැම්බර් 31 දිනට ආයතනයේ නමින් පෞද්ගලික බැංකුවක ස්ථාවර තැන්පතුවක රු.82,900,000 ක මුදලක් ආයෝජනය කර තිබුණත් එම වටිනාකම 2012 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එම මුදල පරිත්‍යාග අරමුදලට (Endowment Fund) අයත් බව විගණනය වෙත දන්වා තිබුණ ද, එම අරමුදල පිළිබඳ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ කිසිදු තොරතුරක් ඇතුළත් කර නොතිබුණි.

(ආ). 2010 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු බවට ගිණුම්ගත කර තිබුණද, භාණ්ඩාගාරයෙන් අදාළ වර්ෂයෙන් පසුව නොලැබෙන මුදලක් වූ රු.793,845 ක් වර්ෂයේ වියදම් ලෙස කපාහැර තිබුණි.

#### 1.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිත අංක 1.

ඡේද අංක 77, 78, 79 හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් වන ආකෘතිය අනුව භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත් නිසියාකාරව වර්ග කර දක්වා නොතිබුණි.

1.2.3 ලැබිය යුතු ගිණුම්

(අ) ණයගැතියෝ

ලැබිය යුතු ගිණුම්වල එකතුව රු.7,402,111 ක් වූ අතර, එය තුළ දීර්ඝ කාලයක සිට පැවත එන රු.1,311,005 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩල ණය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබුව ද එම නිලධාරීන්ට වසරකට වඩා වැඩි කාලයක් සඳහා ණය ලබාදී තිබුණි.

1.2.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය ප්‍රකාර වාර්ෂික, අර්ධ වාර්ෂික හා කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.916,970ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.343,442 ක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.573,528 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) මුළු ආදායම

2011 වර්ෂයේ රු. 101,197,612 ක් වූ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මුළු ආදායම 2012 වර්ෂයේදී රු. 121,441,978 ක් දක්වා රු.20,244,366 කින් එනම් සියයට 20 ක් වැඩි වී තිබුණි. එම වැඩි වීම කෙරෙහි බලපෑ විෂයයන් පහත දැක්වේ.

| විෂයය | ආදායම් | | වැඩි වීම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| භාණ්ඩාගාරයේ දායකත්වය | 13,666,000 | 12,701,000 | 965,000 |
| පරිත්‍යාග අරමුදලේ දායකත්වය | 22,000,000 | 7,500,000 | 14,500,000 |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ ආදායම | 7,651,720 | 3,996,181 | 3,655,539 |
| පොළී ආදායම | 20,386,916 | 14,569,419 | 5,817,497 |
| ශ්‍රවණාගාරය කුලියට දීම | 1,172,320 | 222,140 | 950,180 |

(ආ) ව්‍යාපෘති ආදායම

ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වූ අධ්‍යයන ව්‍යාපෘති වලින් සමාලෝචිත වර්ෂයේ ලද ආදායම රු.49,355,732 ක් වූ අතර, පෙර වර්ෂයේ රු.54,160,812 ක් වූ ආදායම සමඟ සැසඳීමේ දී රු.4,805,080 ක් හෙවත් සියයට 9.8 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 6 වගන්තියේ සඳහන් ආයතනයේ අරමුණු හා පරමාර්ථ අතරින් (අ) උප වගන්තිය අනුව ජාතික සංවර්ධන සැකසුම්වලට හා ප්‍රතිපත්තිවලට අදාළව අධ්‍යයන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ එවැනි තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) පර්යේෂණ වියදම්

2011 වසරේ රු.13,289,655 ක් වූ පර්යේෂණ වියදම් 2012 වසරේදී රු.20,623,821 ක් දක්වා රු.7,334,166 කින් එනම් සියයට 60 කින් ඉහළ ගොස් තිබුණි. ව්‍යාපෘති ආදායම සියයට 10 කින් පහළ යාමේදී පර්යේෂණ වියදම සියයට 60 කින් ඉහළ යාමට හේතුව ආයතනයට ලැබී තිබුණු ව්‍යාපෘති ආයතනයෙන් බාහිර සමාගම් හෝ පුද්ගලයින් ලවා ඉටු කරවා ගැනීමට යොමු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) අධ්‍යයන ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධ්‍යයන ව්‍යාපෘති වෙනුවෙන් අත්සන් කළ ගිවිසුම් නොතිබුණි.

(ii) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හා දේශීය හෝ විදේශීය සේවා යෝජක ආයතන සමඟ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම අවබෝධතා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(iii) අධ්‍යයන ව්‍යාපෘතිවල අවසන් වාර්තාව නිකුත් කිරීම ප්‍රමාද වීම.

(iv) පර්යේෂණ අංශය ඉටු කළ අධ්‍යයනවල ප්‍රගතිය අනුව නියමිත දිනවකවානු තුළ ඉන්වොයිස් නිකුත් නොකිරීම හා ඒ පිළිබඳ පර්යේෂණ අංශය හා ගිණුම් අංශය අතර නිසි සම්බන්ධීකරණයක් නොතිබුණි.

(v) සම්පූර්ණ කළ ව්‍යාපෘති සඳහා ඉන්වොයිස් නිකුත් කර නොතිබුණි.

(ඇ) අධ්‍යයන ව්‍යාපෘති පෞද්ගලික සමාගම් මගින් ඉටු කරවා ගැනීම

i) ශ්‍රී ලංකා රජය හා ඉන්දියාව අතර විදුලිබල සම්ප්‍රේෂණ ජාල අනුපූරක අධ්‍යයන පිළිබඳ අන්තර් සබඳතාව (Feasibility study on the interconnection between India and Sri Lanka power transmission Grids complementary studies to be conducted for the Government of Sri Lanka) හා සම්බන්ධ සක්‍යතා අධ්‍යයන ව්‍යාපෘතිය සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් රු.6,036,820 ක මුදලක් ලැබී තිබුණු අතර, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ එකඟතාවය සහිතව හා එම අමාත්‍යාංශයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි අධ්‍යයනය නිසි පරිදි නිම කළ බවට, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වගකිව යුතු නිලධාරියෙකු හෝ කමිටුවක නිර්දේශ කිරීම්වලින් තොරව ගෙවීම් කටයුතු නිම කර තිබුණි.

- ආයතනය වෙත ලැබෙන විවිධ අධ්‍යයන බාහිර ආයතනවලට පැවරීමේදී මූල්‍ය දායකත්වය වෙනුවෙන් අය කරන මුදල පිළිබඳව සැලකිල්ලක් නොදක්වමින් පිරිවැය ඇස්තමේන්තු සකස් කර ඇති බවට විගණනයේදී තහවුරු විය.
- මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ප්‍රසම්පාදන විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

ii) ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම හා ඉන්දීය වෙළෙඳ ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාව තුළ තිබෙන වෙළෙඳ අවස්ථා පිළිබඳ අත්පොත ( Hand book on the Indian –SL free trade Agreement/Trade opportunities in SL for the Indian business community) යන අධ්‍යයන දෙකම ඉන්දීය මහ කොමසාරිස් සමඟ අත්සන් කළ ගිවිසුමක් මත ආරම්භ කර තිබුණි. ගිවිසුම් අනුව පිළිවෙලින් රු.700,000ක් හා රු.705,000 ක් වශයෙන් එකතුව රු.1,405,000 ක් කොන්ත්‍රාත්තුව අවසානයේදී ගෙවිය යුතු විය. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා ගිවිසුම් අත්සන් කළ 2011 මාර්තු 07 දින සිට දින 14 ක් ඇතුළත එනම් 2011 මාර්තු 21 දින ඉන්දියානු මහ කොමසාරිස්වරයා විසින් රු.700,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* ගිවිසුම ප්‍රකාරව 2011 මැයි 31 දින වන විට අවසන් කෙටුම්පත හා අත්පොත් 1,000 ක් මුද්‍රණය කර භාර දිය යුතු වුවත්, නියමිත දිනට කටයුතු කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

* ඉන්දියානු මහ කොමසාරිස්ගෙන් අය කර ගත යුතු ඉතිරි රු.705,000 ක මුදල අය කර ගැනීම සම්බන්ධව ප්‍රමාණවත් සැළකිල්ලක් දක්වා නොතිබුණි.

(iii) උතුරු - නැගෙනහිර පළාත් සේවා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පළාත් පාලන සමීක්ෂණ පැවැත්වීම සඳහා උපදේශන සේවා සැපයීමේ අධ්‍යයන ව්‍යාපෘතියට ( consultancy service for local authority survey for Northern and Eastern province North East local service Improvement project) අදාළ ක්ෂේත්‍ර වැඩ සඳහා රු.1,382,500 ක් වටිනා කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ප්‍රසම්පාදන විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) <u>ලිඛිත ඉල්ලීම් රහිතව ඉටු කළ ව්‍යාපෘති</u>

අවිධිමත් ක්ෂේත්‍ර පිළිබඳ සමීක්ෂණය සහ සේවයේ නියුක්ත කළ හැකි ආබාධිතයින් පිළිබඳ සමීක්ෂණය ( Survey of informal sector Enterprises and survey of employable disables) පිළිබඳව පවත්වාගෙන ඇති ගොනුව අනුව ඉහත ව්‍යාපෘතිය කම්කරු දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ඉටු කර කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ආදායම රු.564,163 කි. මෙම අධ්‍යයන සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද කිසිදු ලිඛිත ඉල්ලීමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) පර්යේෂණ ව්‍යාපෘති ඉටු කළ හැකි පුද්ගලයින් හා ආයතන ලියාපදිංචි කර ගැනීම පිළිබඳ තොරතුරු ලේඛන ගත කර නොතිබුණි.

(ඊ) ඉන්වොයිස් වටිනාකම රු.1,725,733 ක් වූ ගනුදෙනු සඳහා එකතු කළ අගය මත බදු රු.184,900ක් ගනුදෙනුකරුවන්ගෙන් අය කර නොතිබුණි.

(උ) සේවක සුභ සාධන කටයුතු වෙනුවෙන් අරමුදලක් වසර 9 කට පෙර පිහිටුවා තිබුණු අතර සමාලෝචිත වසර අවසානය වන විට එම අරමුදලේ රු.1,300,225 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. 2012 මැයි 31 දින වනවිටත් අරමුදල විසින් නිලධාරීන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් කිසිදු වියදමක් කර නොතිබුණි.

(ඌ) 2011 වසරේ රු.1,425,719 ක් වූ දේශන හා වැඩමුළු වියදම සමාලෝචිත වර්ෂයේ රු.5,574,930ක් දක්වා රු.4,149,211 කින් එනම් සියයට 291 කින් වැඩි වී තිබුණි. වැඩමුළු වියදම් ඉහළ ගිය ද පෙර වර්ෂයේ වැඩමුළු ආදායම වූ රු.3,996,181 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.7,651,720 ක් වූ බැවින් ආදායම වැඩි වී තිබුණේ සියයට 91 කින් පමණි.

3.3 දෘශ්‍ය අක්‍රමිකතා

අ) පෞද්ගලික අංශයේ ආපදා අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා උපදේශන සේවා ලබාදීමේ (PJ 65 – F Consultancy for a study on private sector disaster Risk Reduction) ව්‍යාපෘතිය UNISDR ආයතනයේ අධ්‍යයන ව්‍යාපෘතියක් වන අතර, මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම ආයතනයේ නිලධාරීන් තිදෙනෙක් වෙත පවරා තිබුණි. ඇමෙරිකානු ඩොලර් 10,000 ක මුදල අධ්‍යයන ව්‍යාපෘතිය භාරව කටයුතු කළ නිලධාරිනියකගේ පෞද්ගලික බැංකු ගිණුමට ලැබී පසුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ගිණුමට බැර කර තිබුණි. පර්යේෂණ කාර්ය මණ්ඩලය සේවාදායක ආයතනවලට

පෞද්ගලික බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු ලබාදීමේ අවශ්‍යතාවය විගණනයේදී පැහැදිලි නොවීය.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ කාර්ය මණ්ඩල වියදම රු.49,860,529 ක් වූ අතර, එය පසුගිය වසරේ කාර්ය මණ්ඩල වියදම වූ රු.46,371,858 ට සාපේක්ෂව රු.3,488,671 කින් වැඩි වී තිබුණි.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (බී) ඡේදය අනුව සෑම ආයතනයක්ම අනුමත කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතු වුවද, ආයතනයේ කාර්ය මණ්ඩල (Cardre) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය අනුව වැටුප් හා දීමනා සම්බන්ධව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ කාර්ය මණ්ඩල සාමාජිකයින් 20 දෙනෙකු වෙත 2012 වසර තුළ පවරා ඇති ව්‍යාපෘති, එම ව්‍යාපෘතිවල ප්‍රගතිය හා කාර්ය මණ්ඩලය නිරත වූ වෙනත් රාජකාරී වෙතොත් ඒ පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණත් අසම්පූර්ණ විස්තරයක් විගණනය සඳහා ඉදිරිපත් විය. 1988 අංක 53 දරන ශ්‍රී ලංකා අධ්‍යයන ආයතන පනතේ 6(අ) වගන්තිය අනුව ආයතනය එහි මෙහෙයුම් අත්පොතක් සැලසුම් කර එහි ප්‍රතිපාදන අනුව කටයුතු කරන බව සභාපතිවරයා දන්වා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2013 වර්ෂයෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එය කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර තිබූ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.

4.3 විගණන කමිටු

2012 වර්ෂය තුළ විගණන කමිටුව රැස්වීම් එකක් පවත්වා තිබුණත් විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකු නිරීක්ෂකයෙකු ලෙස සහභාගි කරවාගෙන නොතිබුණි.

4.4 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.5 අයවැය පාලනය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2012 වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර, රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවට යැවීම සඳහා ගිවිසුම් ගත සේවා සඳහා යන වියදම පමණක් ගණන් බලා ඉදිරිපත් කර තිබුණි.

4.6 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

(අ) පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2012 ජූලි 26 දින රැස්වීම් නියෝග.

(i) මානව සම්පත් කළමනාකරණ කාර්ය පරිපාටිය සඳහා නියෝග අංක 10 පරිදි භාණ්ඩාගාරයේ ලිඛිත අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) මෙහෙයුම් අත්පොත් සඳහා නියෝග අංක 12 පරිදි භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iii) නියෝග අංක 20 පරිදි පරිත්‍යාග අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් ගිණුම් පිළියෙල කොට විගණනය සඳහා ඉදිරිපත් කිරීම අධීක්ෂණය කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ටොරින්ටන්හි පිහිටි සමෘද්ධි පැළ තවාන ඉඩමෙන් අක්කර ½ ක් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ලබා දී තිබූ අතර ඒ සඳහා බදු කුලී ලෙස රු.5,460,000 ක මුදලක් දැනට ගෙවා තිබුණ ද ඒ සඳහා මෙතෙක් දීර්ඝ කාලීන බදු ඔප්පුව ලැබී නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අධ්‍යයන ව්‍යාපෘති.

(ආ) ණයගැති පාලනය.

(ඇ) කාර්ය මණ්ඩල ණය.

(ඈ) පුස්තකාල පොත් පරිහරණය.